**වර්ෂ 2022 ක් වූ සැප්තැම්බර් මස 15 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ඒ නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
04. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
05. ගරු මන්ත්‍රී - ටී.ඒ.ඩී.සී දමයන්ති මිය
06. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
07. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
08. ගරු මන්ත්‍රී - ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
09. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය
10. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
11. ගරු මන්ත්‍රී - එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
12. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
13. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
14. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
15. ගරු මන්ත්‍රී - කේ.ඕ සෝමතිලක මහතා
16. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
17. ගරු මන්ත්‍රී - එච්.ඒ.එන්.සී රණසිංහ මහතා

නොපැමිණීම

01. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
02. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
03. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරිම**

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

පසුගිය සභා වාර්තාවේ මා විසින් ඉදිරිපත් කර ඇති වැවේගම සුසාන භූමිය මට්ටම් කිරීම යෝජනාවේ 2" (අඟල් 2) බට ලෙස සටහන්ව ඇති නමුත් එය 1/2" (අඟල් 1/2) බට ලෙස සඳහන් විය යුතු බැවින් එම සංශෝධනය සහිතව 2022 අගෝස්තු මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2022 අගෝස්තු මස මහා සභා වාර්තාව පෙන්වා දෙන ලද සංශෝධනය සහිතව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය

2023 වර්ෂයේ අයවැය සඳහා ව්‍යාපෘති යෝජනා යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 02 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

2022 සභා අරමුදල් සංවර්ධන යෝජනා 2022.09.15 දිනට ප්‍රගතිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 03 ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එල්. සී. ආර්. මොල්ලිගොඩ මැතිතුමා වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් රු. 40,000/- ක මුදලක් ග්ලෙන්ෆන් වතු නිවාස සඳහා පීවීසී බට ලබා දීම වෙනුවෙන් සභා අරමුදලින් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන පෙරමඟ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉගෙනුම ලබන සිසුන් වෙනුවෙන් නිල ඇඳුම් කට්ටල දෙකක් බැගින් ලබා දීම සඳහා සිසුන් 50 දෙනෙකු වෙනුවෙන් එක් නිල ඇඳුමක් රු. 1025/- ක් බැගින් නිල ඇඳුම් කට්ටල් දෙක බැගින් ලබා දීම සඳහා රු. 102,500/- ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන කොමසාරිස්,පළාත් පාලන දෙපාර්තමේන්තුව,පල්ලේකැලේ,කුණ්ඩසාලේ

තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය

විමර්ශන වාර්තාව - බල ප්‍රදේශයේ ප්‍රජා ශාලා අලුත්වැඩියා කිරීමට අදාළවයි යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

විදුලිය භාවිතය අවම කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 පළාත් පාලන සහකාර කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය

රාජකාරියට වාර්තා කිරීම සම්බන්ධවයි. එච්. ඒ. චාමර මයා - ආදායම් පරීක්ෂක යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 09 විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 10 විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 11 ප්‍රසම්පාදන දැන්වීම - පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව

බෝහිල්වත්ත පාලම ඉදිකිරීම, ඉහුරු ඔය හරහා ඇති ඉහුරු ඔය පාලම ප්‍රතිසංස්කරණය කිරීම, දොරුවාදෙණිය හා වරකාව අතර එල්ලෙන පාලම ප්‍රතිසංස්කරණය කිරීම, ගලබොඩ පාර පැරණි තේ කම්හල අසල බෝක්කුවේ ඉතිරි වැඩ නිම කිරීම යන කර්මාන්ත ඉටු කිරීම සඳහා ලංසු කැඳවීමේ ප්‍රසම්පාදන දැන්වීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

**03. මහජන පෙත්සම්,පැමිණිලි හා ලිපි සභාගත කිරීම**

නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

05 - 01 ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

බලන්තොට උතුර කලුගලපතන මාර්ගයේ බෝක්කුව අලුත්වැඩියා කිරීම සඳහා ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් රු. 50,000.00 ක් වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි වාර්තාව අනුව ඉදිරි කටයුතු කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

නාවලපිටිය දිසා අධිකරණයේ නඩු අංක 84758 සඳහා 2022.09.12 වන දින විභාගය සඳහා පෙනී සිටීමේ ගාස්තු ලෙස රු. 10,000.00 ක් නීතීඥ නයනානන්ද අලුත්ගමගේ මහතා වෙත ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මහින්ද ගුණසේකර මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ඉහත මුදල ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව මඟින් පෙර පාසල් දරුවන්ගේ දැනුම කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් උපුල් වීරසිංහ

මහතාගේ සම්පත්දායකත්වයෙන් පැවැත්වීමට නියමිත සෞන්දර්යාත්මක වැඩසටහන සඳහා 2022 අයවැය යෝජනාව මඟින් වෙන් කර ඇති ළමා සංවර්ධන වැඩසටහන යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන යටතේ රු. 100,000.00 ක උපරිමයකට යටත්ව මහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

මැනුම් ඉල්ලීම් අංක KDS/PBK/4/2 – 28/2022(524) කාරණය සම්බන්ධයෙන් මාපාකන්ද උතුර ග්‍රාම නිලධාරි වසමේ මු. පි. මහ 2316 හි කැබලි අංක 106 මඟින් වන ඉඩමෙන් කොටසක් අප සභාව වෙත පවරා දීමට අදාල වන (ක්‍රීඩා පිටියක් හා ප්‍රජා ශාලාව සඳහා) ඉඩම් කොටස මැනීම සඳහා වන මැනුම් ගාස්තු ලෙස රු. 22,400.00 ක් මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

2022.09.01 දින සිට වැට් බද්ද 15% වී ඇති බැවින් මැනුම් ගාස්තුව සංශෝධනය විය හැකි බවද දන්වා ඇති බැවින් එම සංශෝධනය මුදලද ගෙවීමට අපට සිදු වෙනවා.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මුදල් ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 05 ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් බව්වාගම සිරි ධම්මරතන පිරිවෙනට රු. 100,000.00 ක මුදලින් ඇඳි රහිත පුටු ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 06 ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා</u>

2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් බව්වාගම මරණාධාර සමිතියට රු. 100,000.00 ක මුදලින් ඇඳි රහිත පුටු ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 07 ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා

2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් හෝල්ගම ශ්‍රී සුදර්ශනාරාමය විහාරස්ථානය සඳහා රු. 100,000.00 ක මුදලින් ඇඳි රහිත පුටු ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ටී.ඒ.ඩී.සී දමයන්ති මිය

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශයන් සහ මහ සභාවේ අනුමැතිය මත 2022.09.24 දින පැවැත්වීමට යෝජිත පෙර පාසල් ගුරුවරුන් සඳහා වූ පොත් බයින්ඩින් වැඩමුළුව සඳහා 60 දෙනෙකු පමණ සහභාගි වන බැවින් ඒ සඳහා සංග්‍රහ වියදම් ලෙස රු. 7,700.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මුදල් ගෙවීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

සීමාසහිත නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් JCB යන්ත්‍රය සඳහා කුලී ගෙවීම යන කරුණට අදාලව එවා ඇති ලිපියට අනුව අය වීමට ඇති මුදල අය කර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ඉහත සමිතියේ දියර කිරි කර්මාන්ත ශාලාවේ සහ භූමියේ සංවර්ධන කටයුතු සඳහා වන ව්‍යාපෘති භූමිය මැදින් තිබූ පාර ඉවත් කර ඉඩමේ අයිනට කිරීමේ අවශ්‍යතාවය නිසා පොදු පාර කැපීම සිදු කළා. එය ව්‍යාපෘතියේම කොටසක් නිසා ගාස්තු අඩු කිරීමක් කරන්න බැහැ. JCB යන්ත්‍රය සඳහා ගාස්තු අය කිරීම වර්තමාන ඉන්ධන මිලේ සිදුවන විචල්‍යත්වයන් පදනම් කර ගෙන සිදු කර නැති බැවින් ආයතන සඳහා ලබා දීමේදී ගාස්තු අඩු කිරීමක් කිරීමට අනුමැතියක් ලබා දීලා නොමැති නිසා අදාල ගාස්තුව ගෙවිය යුතුයි. සභාවෙන් අය විය යුතු හිඟ මුදල සම්බන්ධයෙන් කිසිඳු ලිඛිත සටහනක් හෝ ණය හිමි සටහනක් සභාව සතුව නොවන නිසා මෙම ආයතනයේ අදාල තොරතුරු ඇත්නම් එය සභාව වෙත ලබා දීමට දැන්වීමක් කරන්න කියන්න. මේ කරුණු සියල්ලම

ඇතුලත් කරලා සීමාසහිත නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලිපියක් සකස් කර යවන්න. අපේ සභාව වෙත අය වීමට තියන මුදල් අය කර ගන්න කටයුතු කරන්න.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශයන් මත බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ප්‍රජා ශාලා නඩත්තු නොකිරීමෙන් සිදුවන රජයේ මුදල් අපතේ යාම වළකාලීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව ගරු මහා සභාවේ එකඟතාවය ලබා ගැනීම සම්බන්ධ ලිපියට අනුව සභාව සතු ප්‍රජා ශාලා නඩත්තුව සඳහා සහා අරමුදල් යෙදවීමටත් අනෙකුත් ප්‍රජා ශාලා සභාව වෙත පවරා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවටත් බලංතොට උතුර ප්‍රජා ශාලාව සභාවට පවරා දෙන ලෙසට ලිපියක් යැවීම සුදුසු බවටත් මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

යම් ආයතනයකින් මුදල් අපිට වෙන් කරලා දීලා අපි ඒ ප්‍රජා ශාලා හැදුවට එතනින් එහාට ඒ ප්‍රජා ශාලා නඩත්තු කරන්න් බැහැ. කිසිම ආයතනයක් නඩත්තු කරන්නේ නෑ. අපේ ප්‍රජා කමිටුවේ කථා කරනවා ප්‍රාදේශීය සභාවට අයත් නොවන ඒවා කරන්න එපා ඒත් මේවා නඩත්තු කරන්න ඕනි නැත්තම් අභාවයට යනවා කියන කාරණය. ජනතාවට තියන නෛතික ප්‍රතිපාදන අනුව කරන්න වෙන්නේ ගරු මන්ත්‍රීවරයෙකු යටතේ පොදු අරමුදල් යටතේ ප්‍රතිපාදන වෙන් කර ගැනීමට හැකියාවක් තියනවා නම් අපේ නොවන ප්‍රජා ශාලාවල සංවර්ධන කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගන්න ඕනි. අපේ ප්‍රජා ශාලා තියනවානම් අපිට හැකියාව තියනවා අපි නඩත්තු කරන්න වැඩපිළිවෙලක් හදන්න.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

බලංතොට උතුර ප්‍රජා ශාලාව පිළිබඳ ප්‍රශ්නය තියනවා.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ඒකේ ගැටළුවක් තියනවා. ඒකට වෙලා තියන දේ තමයි පළමුවන කාරණය එවකට හිටපු පළාත් අධ්‍යක්ෂතුමා, විධායක ඉංජිනේරුවරයා ඇතුළු සියළු කණ්ඩායම් ඇවිල්ලා මමයි උපසභාපතිතුමයි නිලධාරි මණ්ඩලයයි අපේ ගරු ඇමතිතුමයි එක්ක සාකච්ඡා කළා. ඒ ඉඩම ඒ අය දෙන්න එකඟතාවය පළ කළා. ඊට පස්සේ තමයි අපි මේක හැදුවේ. අපේ සල්ලි වලින් නෙවෙයි රජය මඟින් දුන්න සල්ලිවලින් හැදුවේ. ඒත් අවසන් කරන්න බැරි වුණා. ඉන් අනතුරුව RDA එක අපිට පවරා දීමට කිසිම සහයෝගයක් දෙන්නෑ.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

2014 වර්ෂයේදී තමයි මේක ආරම්භ කළේ. ජාතික සවිය ගම නැඟුම ව්‍යාපෘතිය මඟින් කළේ. හිටපු ලේකම්තුමා ගරු උසස් අධ්‍යාපන, මහා මාර්ග, වෙළඳ ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා මැනුම් කටයුතු කරලා සභාවට පවරා දෙන්න කියලා. මෑතකත් අපි සාකච්ඡා කළා. ඒත් ප්‍රමාදයක් තියනවා. දැනට අමාත්‍යාංශයෙන් කටයුතු කරගෙන යනවා ගොඩනැඟිල්ල බාගෙට හදලා තියෙන්නේ මුදල් ගෙවීමේ ප්‍රශ්නයකුත් තියනවා. ඉදිරියේදී සභාවට පවරා දෙන්න ඉඩ තියනවා.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

වෙනත් ආයතවලට අයත් ප්‍රජා ශාලාවලින් ඉල්ලීම් කරන ඒවා අපිට පැවරීම් කරන තෙක් එකඟතා ලිපියක් දෙන්න පුළුවන්නම් සහා  අනුමැතියක් අනුව කටයුතු කරන්න පුළුවන්.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ප්‍රා දේශිය සම්බන්ධීකරණ කමිටුව නැති නිසා තමයි ගැටළුව එතනදී ප්‍රගතිය බලනවා. කාලයක් තිබ්බේ නෑ. එතනදී අපේ ගැටළු සාකච්ඡා කරන්න පුළුවන් තිබ්බානම්.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

ඉදි කරලා වසර 20 කටත් වැඩි උනත් නඩත්තු කරලා නැති නිසා ගැටළු තියනවා. ගොඩක් ඒවා අබලන් තත්වයේ තියෙන්නේ. සභාවේ මුදල් යොදවලා කරන්න පුළුවන්කමක් තියනවා  අර වගේ ක්‍රමවේදයක් යොදා ගත්තනම්.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

බලංතොට උතුර ප්‍රජා ශාලාව පරිහරණය කරන්න දෙන්න කියලා ලිපියක් දාමු.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

අපි දැනට ඉල්ලීමක් කරමු කඩිනම් කරලා දෙන්න කියලා. ප්‍රධාන ගැටළුව තමා අපේ සභාව තිබ්බේ නැති එක. සභාව විසුරුවා හැරිය නිසා තමා ගැටළුව මතු වුනේ.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

විධායක ඉංජිනේරු කාර්යාලයේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ඇවිල්ලා කිව්වා වැඩ ආරම්භ කරගෙන යන්න කියලා. මේ ස්ථානයේ අනවසරයෙන් වෙනත් පුද්ගලයෙක් පදිංචිව හිටියා. ඒ පුද්ගලයාව වෙනත් තැනක පදිංචි කරවලා තමයි ඒ ප්‍රජා ශාලාව හදලා තියෙන්නේ. සභාව වෙනස් වුන නිසා තමයි නතර වුනේ.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ නිර්දේශයන් මත පහත සඳහන් කටයුතු සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

- මැදගහවතුර ප්‍රජා ශාලාව අබලන් තත්වයේ පවතින බැවින් ප්‍රජා මණ්ඩලයේ ඇති බැංකු ශේෂයෙන් මුදල් ලබා ගෙන එය ප්‍රතිසංස්කරණය කිරීම
- මැදගහවතුර වීථි පහන් දෙකක් මේ වන විට අක්‍රිය තත්වයේ පවතින බවත් ඒ ප්‍රතිසංස්කරණය කිරීම
- අප සභාව ඉදිරිපිට බස් රථයෙන් බහින ස්ථානයේ කාණුව විවෘතව පැවතීම අනාරක්ෂිත බැවින් ප්ලේට් 10 ක් යොදා කාණුව ආවරණය කර දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැන්වීම

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ගරු මන්ත්‍රී එස්. එල්. අරුණ ශාන්ත මයාගේ 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මාපාකන්ද උතුර ග්‍රාමයේ සුසාන භූමියට යන මාර්ගය පුළුල් කර ගැනීම සඳහා රු. 100,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ගරු මන්ත්‍රී එස්. එල්. අරුණ ශාන්ත මයාගේ 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගල්පොත්ත පොදු ක්‍රීඩාංගනයට අඩුවක්ව පවතින ක්‍රීඩාගාරයක් ඉදි කර ගැනීම සඳහා රු. 150,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 14 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ගරු මන්ත්‍රී එස්. එල්. අරුණ ශාන්ත මයාගේ 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මාපාකන්ද උතුර ගල්පොත්ත ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා පුටු ලබා ගැනීමට රු. 50,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 15 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ගලබඩ දිය ඇල්ල සංචාරක කලාපය තුළ පරිපාලනය හා සේවාවන් විධිමත්ව පවත්වා ගෙන යාම අරමුණු කර ගනිමින් පනවා ගැනීමට යෝජිත අතුරු ව්‍යවස්ථාවේ කෙටුම්පත සඳහා අවශ්‍ය අඩුපාඩු පිළිබඳව 2022.09.29 දින ක්ෂේත්‍ර චාරිකාවක් යොදා ගෙන ඉන් අනතුරුව සංශෝධන ඉදිරිපත් කිරීමට තීරණය විය.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

එතන ආරක්ෂාව වැඩි කරන්න ඕනි. එක්කෙනෙක් මදි එතනට. කට්ටියක් ආවමටිකට් ගන් නැතුව යන අවස්ථා තියනවා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ගලබඩට දෙන්නෙක් දාලා කම්කරුවෙක් දාලා ශුද්ධ පවිත්‍ර කරලා නඩත්තු කරන්න ඕනි. කවුන්ටරය සඳහා සභාවේ යෝජනාවක් තියනවා. ළඟ පාත ඉන්න කෙනාටත් වෙනම තැනක් දෙනවා. එතන අක්කරයක ඉඩම ප්‍රාදේශිය සභාවට හිමි වෙනවා. රු. 50.00 ක මුදල යම් ප්‍රමාණයකට වැඩි කරන්න පුළුවන්නම් කෙනෙක් යොදවන එකට ගැටළුවක් නැහැ. ඒ ළඟ ඉන්න කෙනෙක් ගන්න පුළුවන්නම් හොඳයි.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

ඇතුල්වෙන තැන ඉඳලා ටිකට් කඩන්න. ඇතුල්වෙන කොට ගේට්ටුවෙන් ඇතුල් වෙන්න දෙන්න.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

ඉදිරි අයවැය මඟින් ගාස්තු සංශෝධනයක් කරන්න.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>

එතනට ගිහින් බලලා අදහස් ගන්න එක හොඳයි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

එතන ආරක්ෂාව සඳහා යන හා එන අය ගනන් කරන්න වැඩපිළිවෙලක් හදමු.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

පිරිසක් යනකොට සංඛ්‍යාව ලියා ගන්න. කැන්ටින් එක ක්‍රියාත්මක කරන්න. කඳවුරු බඳින කණ්ඩායමක් යවන්න පුළුවන්. ඒවගේ අයට අවස්ථාව දෙමු. රාත්‍රී නවාතැන් ගන්න එන අය කලින් ලියාපදිංචි කිරීම ගැන වගන්තියක් දාමු. ක්ෂේත්‍ර චාරිකාව ගිහින් බලලා ඇවිත් සංශෝධන දෙමු.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව ගරු සභාපතිතුමාගේ යෝජනාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 16 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

බව්වාගම පිරිවෙන් විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගේ අපවත් වීම හේතුවෙන් අඳන පිරිකර පූජා කිරීම සඳහා රු. 50,000.00 ක් යෙදවීමට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 17 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු. 100,000.00 ක මුදලක් දඹුබැදිරුප්ප කොට්ඨාශයට විථි පහන් ලබා දීම සඳහා ලබා දීම සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 18 ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>

2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු: 100,000.00 ක මුදලක් පසුගිය දිනවල පැවති අධික වර්ෂාව හේතුවෙන් නාය යාමට ලක්වූ දෙකිඳ පරනවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 19 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

PF – 7405 අංක දරන නිල කැබ් රථය පහත ද්‍රව්‍ය යොදා අලුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

- Rack end 02
- Tie rod 02
- Stabilizer bar link rod 02
- Stabilizer bar cut bush 02
- Cr joint 01
- Axel inner boot 02
- Front brake pad set 01
- Master switch 01
- Door winder 01
- A/C Adjuster bearing 01
- Brake oil 500 ml

- Fan jell (375 x 6) 06
- Coolant flamingo qreen 2l
- Wiper blade (Size 19,21) 02
- Radiator cap 01

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 20 ගරු මන්ත්‍රී ජී.එස්.ජ් ෆොන්සේකා මහතා
2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු: 75,000.00 ක මුදලක් වරකාව ගම්සහා පඩිපෙළ වෙනුවෙන් යෝජනා ස්ථිර වී තිබූ අතර එම යෝජනාව කොට්ඨාශයේ වීථි පහන් ලබා ගැනීමට ලෙස වෙනස් කර උක්ත මුදල ඒ සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 21 ගරු මන්ත්‍රී අයි.රාමකිලි මහතා
2022 වර්ෂය සඳහා මා හට ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 100,000.00 ක මුදලක් බාර්කේපල් මුත්තුමාරි අම්මාන් කෝවිල සංවර්ධනය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.
05 - 22 ගරු මන්ත්‍රී අයි.රාමකිලි මහතා
2022 වර්ෂය සඳහා මා හට ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 100,000.00 ක මුදලක් බාර්කේපල් උඩ කොටසේ මුත්තුමාරි අම්මාන් කෝවිල සංවර්ධනය සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 23 ගරු මන්ත්‍රී අයි.රාමකිලි මහතා

2022 වර්ෂය සඳහා මා හට ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 100,000.00 ක මුදලක් ඉන්වාරා කොටසේ මුත්තුමාරි අම්මාන් කෝවිල සංවර්ධනය සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 24 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

107/2, දෙකිඳ පාර, නාවලපිටිය ලිපිනයේ පදිංචි එම්. එම්. සුගතදාස මයා ජල පරිභෝජනය අත්හිටුවා ඇති බැවින් දැනට ඇති රු. 2,000.00 ක ජල හිඟය නිදහස් කර දෙන කරන ලද ඉල්ලීම අනුව එය කපා හැරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

ජල ප්‍රශ්නය තියන අයට මේ විධියට ඉල්ලීම් කරන්න කියමු. ඉල්ලීම් කරන විධියට පරීක්ෂා කරලා බලලා කපා හරින්න සුදුසුද බලලා ඉදිරි කටයුතු කරමු.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව අනුව එම මුදල කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 25 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022 වර්ෂය සඳහා මා හට ලැබෙන මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 150,000.00 ක මුදලක් ගෝනාවල පතන ගම මැද පාර අබලන්ව ඇති බැවින් එය සංවර්ධනය කිරීම සඳහා වෙන් කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 26 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

දෙකිඳ අලුත්ගම සියපත් පවුර ළමා සමාජය සඳහා වොලිබෝල් උපකරණ හා දැල්පන්දු උපකරණ ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව ඇස්තමේන්තුවක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 27 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

උඩරඹුක්පිටිය දිරිය කාන්තා ග්‍රාමසංවර්ධන සමිතිය මඟින් උඩවලව්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදලට වඩා වැඩියෙන් වැය වූ මුදල වන රු. 8,000.00 ක මුදල එම සමිතිය වෙත ගෙවීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

උක්ත යෝජනාව පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත සමිතිය වෙත එම මුදල ගෙවීම සඳහා ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

05 - 28 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

JCB යන්ත්‍රයට එකවර ඉන්ධන ලීටර 100 ක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 29 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පරිසර කමිටුවේ නිර්දේශ මත කඩියන්ලෙන නගරය පවිත්‍ර කිරීමේ වැඩසටහනක් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 30 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

පරිසර කමිටුවේ නිර්දේශ මත ආහාර සාම්පල් පරීක්ෂා කිරීමේ වැඩසටහන ඉදිරි දිනක ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 31 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශ මත නව සාමාජිකයන් බඳවා ගැනීම හා නොමිලේ සාමාජිකත්වය පිරිනැමීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 32 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
පුස්තකාල උපදේශක කමිටුවේ නිර්දේශ මත බිත්ති පුවත්පත ප්‍රධාන පුස්තකාලයේ හා ජංගම පුස්තකාලවල එළිදැක්වීම හා ඒ සඳහා පහසුකම් සැලසීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
බිත්ති පුවත්පත හදන්න මිල ගණන් දාන්න. කියවීමේ අගය දැක්වෙන උධෘත whatsapp group එකේ හා facebook පිටුවේ දාන්න. වෙනත් පුස්තකාල සමඟ ඒ තොරතුරු බෙදා හැරීමක් කරන්න.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 - 33 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>
දංගොල්ල මාර්ගයේ ගැටළුව නිරාකරණය කිරීම සඳහා 2022.09.20 දින කම්කරුවන් යොදවා සුද්ධ කර මහජනතාවට පරිහරණය කිරීමට සකස් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>
එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

කුමාරි වීරකෝන් මහත්මිය අපි සමඟ ගනුදෙනු කරපු ලියකියවිලිවල පිටපත් එවලා තියනවා. අපිට ඒකට පිළිතුරු ලිපියක් සකස් කරන්න වෙයි.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

කමිටුව නැවත රැස් වෙලා තීරණයක් ගමු. තීරණය ක්‍රියාත්මක කරන්න කාලයක් දෙමු.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

තිබුණු පාර නැවත විවෘත කරලා මහජනතාවට පරිහරණය කරන්න සභාවේ කම්කරුවන් දාලා පවිත්‍ර කරලා දෙමු. සභාවේ බලතල අනුව පාර විවෘත කරලා දෙමු මහජනතාවට.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

කම්කරුවන් 6 දෙනෙක්, තාක්ෂණ නිලධාරි මහතා, පරිසර නිලධාරි මහතා යොදවලා පළමු පියවර විධියට පාර සුද්ධ කරමු.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>05 – 34 ගරු මන්ත්‍රී එච්.ඒ.එන්.සී රණසිංහ මහතා</u>

2022 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් රු: 50,000.00 ක මුදලක් වැවේගම ඉහල පිහිල්ල සංවර්ධන කිරීම වෙනුවෙන් යෝජනා ස්ථිර වී තිබූ අතර එම යෝජනාව දෙකිඳ පරනවත්ත මාර්ගය සංවර්ධනය කිරීම ලෙස වෙනස් කර උක්ත මුදල ඒ සඳහා ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රී කේ.ඕ සෝමතිලක මහතා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා තාක්ෂණ නිලධාරි මගින් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

<u>06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම.**</u>

| | | | |
|---|---|---|---|
| 06 - 01 | මුදල් කාරක සභාව | - | 2022.09.07 |
| 06 - 02 | නිවාස ප්‍රජා සංවර්ධන කාරක සභාව | - | 2022.09.08 |
| 06 - 03 | කාර්මික සේවා කාරක සභාව | - | 2022.09.08 |
| 06 - 04 | පරිසර හා පොදු පහසුකම් කාරක සභාව | - | 2022.09.08 |
| 06 - 05 | ගැටුම් සමථකරණ කාරක සභාව | - | 2022.09.08 |
| 06 - 06 | පුස්තකාල උපදේශක කමිටුව | - | 2022.09.07 |

<u>07. **බැංකු සැසඳුම් ප්‍රකාශය, අභ්‍යන්තර විගණන වාර්තාව, ලැබීම් සාරාංශය, ගෙවීම් සාරාංශය, ගෙවීම් වාර්තාව, පුස්තකාල ප්‍රගතිය, ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම**</u>

- 2022.08.01 දින සිට 2022.08.31 දක්වා වවුචර් අංක 811 සිට 962 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.
- බැංකු සැසඳුම් ප්‍රකාශය

**බැංකු සැසඳුම් ප්‍රකාශනය - 2022 අගෝස්තු**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගිණුම් අංකය :- 053-1-001-6-4889286

මාසය :-2022 අගෝස්තු

| | | | | |
|---|---|---|---|---|
| 2022.08.01 දිනට මුදල් පොතේ ශේෂය | රු. | 2,323,919.56 | | |
| එකතු කළා : අගෝස්තු මස මුලු ලැබීම් | රු. | 6,069,158.00 | | |
| අඩු කළා :- අගෝස්තු මස මුළු ගෙවීම් | රු. | 6,770,740.62 | | |
| 2022.08.31 දිනට මුදල් පොතේ ශේෂය | | | රු. | 1,622,336.94 |
| <u>එකතු කළා</u> | | | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (උ:ලේ 01) | රු. | 1,534,408.97 | | 1,534,408.97 |
| | | | | 3,156,745.91 |
| <u>අඩු කළා</u> | | | | |
| අත ඉතිරි මුදල් හා චෙක්පත් (උ:ලේ 02) | රු. | 257,320.55 | | |
| බැංකු ගාස්තු (උ:ලේ 03) | රු. | 112.00 | | |
| | | | රු. | 257,432.55 |
| 2022.08.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | | 2,899,313.36 |

- 2022 අගෝස්තු මස ගෙවීම් සාරාංශය

**<u>පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව</u>**

**<u>මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2022 අගෝස්තු මාසය</u>**

| අය විෂය නාමයන් | එකතුව | මුළු එකතුව |
|---|---|---|
| | | |
| 01. වැටුප් හා දීමනා | 3,210,365.93 | |

| | | |
|---|---|---|
| 02. ගමන් වියදම් | 24,762.00 | |
| 03. සැලසුම් හා උපකරණ | 737,350.00 | |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 171,255.00 | |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 309,278.93 | |
| 06.පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 20,019.24 | |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 33,530.79 | |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතොෂිත | 10,320.64 | |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **4,516,882.53** |
| ප්‍රාග්ධන වියදම් | | |
| 09.ප්‍රාග්ධන වැය | 450,063.24 | |
| 10. ණය ආපසු ගෙවීම් | 235,162.62 | |
| **ප්‍රාග්ධන වැය එකතුව** | | 685,225.86 |
| **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධන වැය මුළු එකතුව** | | **5,202,108.39** |
| විවිධ ණය හිමියන් | 197,400.00 | |
| කර්.ණය හිමියන් (309-3-I) | 19,990.00 | |
| කර්.ණය හිමියන් (309-3-III) | 1,506,792.47 | |
| කර්.ණය හිමියන් (304-5) | - | |
| 10% කර්මාන්ත තැන්පත් | 10,983.36 | |
| විවිධ තැන්පත් | 13,200.00 | |
| මුද්දර තැන්පත් | - | |
| දේපල ණය පොළී | 12,408.90 | |
| සේවක ණය | - | |
| අත්තිකාරම් | 584,310.00 | |
| සමුච්චිත අරමුදල | - | |
| ලිපි ද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 10,124.00 | |
| ජල ගබඩා අත්තිකාරම් | | |
| අගරු චෙක්පත් | | |
| කර්.ණය ගැතියන් | | |
| **එකතුව** | | **2,355,208.73** |
| **2022/08/31 දක්වා මුළු ගෙවීම් වල එකතුව** | | 7,557,317.12 |

- 2022 අගෝස්තු මස ලැබීම් සාරාංශය

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

**2022 අගෝස්තු මාසය සඳහා ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

| අය විෂයන් | මුළු එකතුව | |
|---|---|---|
| | රු. ශත | |
| 10 වරිපනම් හා බදු | **437,718.72** | |
| 20 කුලී | **190,293.80** | |
| 30 බලපත්‍ර ගාස්තු | **39,762.00** | |
| 40 සේවා සඳහා ගාස්තු | **505,296.00** | |
| 50 වරෙන්තු ගාස්තු | **4,158.37** | |
| 60 වෙනත් ආදායම් | **458,009.29** | |
| 70 වෙනත් ආධාර | **3,016,700.91** | |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **4,651,939.09** |
| ප්‍රාග්ධන ආදායම | **-** | |
| 80 මූලධන ලැබීම් | | |
| එකතුව | | - |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව | | **4,651,939.09** |
| **වෙනත් ලැබීම්** | | |
| ජල ණයගැතියෝ | **19,042.00** | |
| ජල තැන්පත් | **2,000.00** | |
| මුද්දර | **3,875.00** | |
| විවිධ තැන්පත් | **57,263.19** | |
| සේවක ණය | **239,032.00** | |
| කර්මාන්ත තැන්පත් | **29,921.32** | |
| දේපල ණය | **12,408.90** | |
| විවිධ ණයගැතියෝ | | |
| අත්තිකාරම් පියවීම | **513,700.00** | |
| ජල ගබඩා අත්තිකාරම් පියවීම | | |
| රු 25 මුද්දර | **1,525.00** | |
| කර්මාන්ත ණයගැතියෝ | **1,325,028.00** | |
| වෙනත් ලැබීම් වල එකතුව | | **2,203,795.41** |
| 2022/08/30 දක්වා මුළු ලැබීම් එකතුව | | **6,855,734.50** |

- 2022 අගෝස්තු මස පුස්තකාල ප්‍රගතිය

01. නව සාමාජික සංඛ්‍යාව - 74

02. සාමාජිකත්වය අලුත් කළ සංඛ්‍යාව - 08

03. පොත් බැහැර දීම - 1,295

04. ව්‍යාප්ත සේවා -

05. රැස්කළ ආදායම (පුස්තකාල) - 1,890.00

(නැණසල) - 1,080.00

**08.ටෙන්ඩර් මණ්ඩලය**

08 - 01 පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සඳහා LED වර්ගයේ වර්ණ රූපවාහානී යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| අනුඅංකය | ද්‍රව්‍යය | සිතා හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | | | ඩැමරෝ ආයතනය | | | සිංගර් ආයතනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය |
| 1 | අඟල් 32 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | LMG LED | 62,900.00 | 2 year | Inovex | 76,855.00 | 3 year | Panasonic | 79,999.00 | 3 year |
| | | AIWA | 74,990.00 | 3 year | | | | | | |
| 2 | අඟල් 40 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | AIWA | 89,990.00 | 3 year | | | | Singer | 110,174.00 | 2 year |
| 3 | අඟල් 50 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | AIWA | 249,990.00 | 3 year | Hisense | 237,405.00 | 3 year | Singer | 193,649.00 | 2 year |
| 4 | අඟල් 65 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | AIWA | 425,000.00 | 3 year | Hisense | 378,955.00 | 3 year | | | |
| | | | | | Valid one day | | | 2022.09.27 දින දක්වා වලංගු වේ. | | |

| අනු අංකය | ද්‍රව්‍යය | දිනපාල පුද්ගලික සමාගම | | | සොෆ්ට්ලොජික් ආයතනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය |
| 1 | අඟල් 32 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | Fuji | 59,950.00 | 3 year | Softlogic | 73,990.00 | 3 year |
| 2 | අඟල් 40 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | TCL | 94,500.00 | 3 year | Softlogic | 148,690.00 | 3 year |
| 3 | අඟල් 50 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | Hisense | 249,900.00 | 3 year | Softlogic | 238,490.00 | 3 year |
| 4 | අඟල් 65 LED වර්ගයේ වර්ණ රූපවාහිනී | Hisense | 398,500.00 | 3 year | Samsung | 585,290.00 | 3 year |
| | | | | | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 02 ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා මිල ගණන් කැඳවීම.

| RL ZONE, Gampola | New Star Electronics, Ulapane | Prasad Electronics, Nawalapitiya |
|---|---|---|
| 54,700.00 | 58,500.00 | 49,930.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 වීථි ලාම්පු සවි කිරිම සඳහා මිල ගණන් කැඳවීම.

| අංක | විස්තරය | Atlas Elecricals, Kandy | Galle Electrical Ltd, Kandy | Lakru, Rambukpitiya | Priya Stores, Gampola | සතුෂා Electricals, Nawalapitiya | Nawalapitiya Electrical |
|---|---|---|---|---|---|---|---|
| 1 | එක් විදුලි කාන්දු ඇමුණුමක් සඳහා pvc line tap | 560.00 | 580.00 | 530.00 | 410.00 | 395.00 | 365.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “නාවලපිටිය ඉලෙක්ට්‍රිකල්, නාවලපිටිය” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 04 වෙළඳ බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම.

| Sayara Graphic & Printing Solutions | Rajah Press | Midland Printers |
|---|---|---|
| 18,800.00 | 18,000.00 | 19,000.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “Rajah Press, නාවලපිටිය” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 05 ගිනි නිවන උපකරණ යාවත්කාලින කිරිම සඳහා උපාංග මිලදී ගැනීමට මිල ගණන් කැඳවීම.

| අංකය | විස්තරය | FireREX Safety Engineering | Total Fire Protection | Sightline Fire Protection |
|---|---|---|---|---|
| 1 | 9lt Water Type fire extinguisher | 8,500.00 | 7,000.00 | 7,750.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | 2kg Carbon Dioxide fire extinguisher | 12,500.00 | 10,500.00 | 11,250.00 |
| 3 | Transport Charges | 10,000.00 | 5,000.00 | 6,000.00 |
| | Total | 31,000.00 | 22,500.00 | 25,000.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති "Total Fire Protection, වැලිගල්ල, ගම්පොල" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 06 ට්‍රැපික් කෝන් මිලදී ගැනීමට මිල ගණන් කැදවීම.

| විස්තරය | Nippon Plastic | Wayamba Polymers (Pvt) Ltd | Namal PVC |
|---|---|---|---|
| 70cm Traffic Cone | 6,500.00 | 6,000.00 | 6,800.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා අවම මිල ගණන් සපයා ඇති "Wayamba Polymers (Pvt) Ltd, නාවල, රාජගිරිය" යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 07 රොසැල්ල හයිඩ්‍රි වත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයට අවශ්‍යා කරන වීදුරු,පිඟන් හා පීරිසි කෝප්ප ලබා දීම සඳහා මිල ගණන් කැදවීම.

| අංකය | විස්තරය | Reagal Enterprise | Bobby Stores | Amma Fancy |
|---|---|---|---|---|
| 1 | 6 pcs cup & soures set 1 | 5,400.00 | 8,100.00 | 5,400.00 |
| 2 | Plate 6 | 6,000.00 | 8,700.00 | 6,000.00 |
| | Total | 11,400.00 | 16,800.00 | 11,400.00 |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සදහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 - 08 252 – 6380 වාහනය අලුත්වැඩියාවට මිල ගණන් කැදවීම.

| අනු අංකය | ද්‍රව්‍යය | UP - Country Motors | | | Union Enterprises | | | Hemal Motors | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය | වර්ගය | ඒකක මිල | වගකීම් කාලය |
| 1 | ටයිමින් බෙල්ට් | Sun.Japan | 15,900.00 | 100000km | Bando | 16,500.00 | | Sun | 17,900.00 | |
| 2 | එජස්ටර් | NTN.Japan | 7,750.00 | | NSK | 9,500.00 | | NSK | 11,500.00 | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “UP - Country Motors, නාවලපිටිය” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 09 LL -7484 කැබ් රථය අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැදවීම.

| අංකය | විස්තරය | ඒකක ගණන | සුසන්ත මෝටර්ස් | සමන්ත ඉලෙක්ට්‍රිකල්ස් | ශ්‍රී ලේ මෝටර්ස් |
|---|---|---|---|---|---|
| 1 | පිස්ටන් | 4 | 47,500.00 | 87,000.00 | 47,500.00 |
| 2 | රින්ග් සෙට් | 4 | 30,000.00 | 38,500.00 | 30,000.00 |
| 3 | ඔයිල් පිල්ටර් | 1 | 5,000.00 | 7,000.00 | 5,000.00 |
| 4 | පිස්ටන් ලයිනර් | 4 | 83,900.00 | 93,000.00 | 83,900.00 |
| 5 | ගැස්කට් ඕරෝල් කිට් | 1 | 19,500.00 | 17,500.00 | 17,500.00 |
| 6 | එන්ජින් මවුන්ට් | 2 | 10,500.00 | 7,200.00 | 10,500.00 |
| 7 | ඩීසල් පිල්ටර් | 1 | 4,500.00 | 4,000.00 | 9,300.00 |
| 8 | ෆෑන් බෙල්ට් | 1 | 4,900.00 | 3,500.00 | 4,200.00 |
| 9 | පවර් බෙල්ට් | 1 | 3,750.00 | 6,200.00 | 3,500.00 |
| 10 | ගැස්කට් සැලැක් | 2 | 3,900.00 | 3,300.00 | 4,200.00 |
| 11 | වැල් | 8 | 30,000.00 | 43,200.00 | 30,000.00 |
| 12 | වැල් ගයිඩ් | 8 | 19,500.00 | 11,700.00 | 19,500.00 |
| 13 | රේඩියේටරය අලුත්වැඩියා කිරීමට | | 6,500.00 | 6,500.00 | 6,000.00 |
| 14 | මේන් බෙයාරින් | 1 | 20,000.00 | 18,000.00 | 20,000.00 |
| 15 | බිගන් බෙයාරින් | 1 | 25,000.00 | 13,500.00 | 25,000.00 |
| 16 | ක්‍රැන්ක් ප්ලේ වොෂර් | 1 | 9,300.00 | 9,000.00 | 9,400.00 |
| 17 | වැඩ කුලිය | | 55,000.00 | 50,000.00 | 55,000.00 |
| | Total | | 378,750.00 | 419,100.00 | 380,500.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

08 - 10 31 ශ්‍රී 9698 ජීප් රථය අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැදවීම.

| අංකය | විස්තරය | උදාර මෝටර්ස් | අමෂිටය මෝටර්ස් | ශාන්ත ජෝශප් බ්‍රදර්ස් |
|---|---|---|---|---|
| | අමතර කොටස් හා මිල ගණන් | | | |
| 1 | ඉදිරි පස හා පිටුපස බ්‍රේක් ලයිනර් | 10,800.00 | 12,000.00 | 14,200.00 |
| 2 | ඉදිරිපස බ්‍රේක් වොසර් 4 | 2,000.00 | 2,600.00 | 2,800.00 |
| 3 | පිටුපස බ්‍රේක් වොසර් 8 | 3,600.00 | 3,800.00 | 4,200.00 |
| 4 | බ්‍රේක් මාස්ටර් පොම්පය | 24,000.00 | 27,000.00 | 27,500.00 |
| 5 | ඩීසල් හෝස් එක 4m | 1,900.00 | 2,200.00 | 3,200.00 |
| 6 | බ්‍රේක් ඔයිල් ලොකු කෑන් 2 | 4,800.00 | 4,900.00 | 5,000.00 |
| 7 | රබර් ග්‍රීස් හා හෝස් ක්ලිප් | 700.00 | 900.00 | 1,100.00 |

| | | | | |
|---|---|---|---|---|
| 8 | බ්‍රේක් ඩ්‍රම් 4 පෙස් කිරීම | 6,000.00 | 7,000.00 | 8,500.00 |
| | එකතුව | 53,800.00 | 60,400.00 | 66,500.00 |
| | | | | |
| | වැඩ කුලිය හා වැඩ කොටස | | | |
| 1 | ඉදිරිපස බ්‍රේක් වොසර් හා ලයිනර් දමා සවිකිරීම | 3,800.00 | 4,500.00 | 4,900.00 |
| 2 | පිටුපස බ්‍රේක් වොසර් හා ලයිනර් දමා සවිකිරීම | 4,200.00 | 8,300.00 | 8,800.00 |
| 3 | බ්‍රේක් මාස්ටර් පොම්පය සවි කිරීම | 3,500.00 | 4,000.00 | 4,600.00 |
| 4 | ඩීසල් ටැංකිය ගලවා පි රිසිදු කර අමතර කොටස් දමා සවි කිරීම | 6,300.00 | 7,000.00 | 7,800.00 |
| 5 | බ්‍රේක් එජස් කර බැලන්ස් කිරීම | 650.00 | 1,000.00 | 1,500.00 |
| | එකතුව | 18,450.00 | 24,800.00 | 27,600.00 |
| | | | | |
| | මුළු එකතුව | 72,250.00 | 85,200.00 | 94,100.00 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා අවම මිල ගණන් සපයා ඇති “උදාර මෝටර්ස්, ඉඹුල්පිටිය, නාවලපිටිය ” යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට තීරණය කරන ලදී.

## 09. වෙනත් කරුණු

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා විසින් ගෞරවණීය පොල්ගස්වත්තේ ජිනරතන මහා ස්වාමීන්වහන්සේගේ අපවත්වීම වෙනුවෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශිය සභාවේ ශෝකය ප්‍රකාශ කරමින් පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.20 පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

මන්ත්‍රීතුමන්ලාගෙන් යෝජනා අරගෙන වාර්තාවක් හදලා තාක්ෂණ නිලධාරි මහතා එන දවස් අනුව ඇස්තමේන්තු හදන්න. තාක්ෂණ නිලධාරි මහතාගෙන් දින ටික අරගෙන මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා අරගෙන වාර්තාව හදන්න. කොට්ඨාශ 2 ක් විතර දවසකට බලන්න පුළුවන්. ඉදිරි සති 2 ඇතුළත පසුගිය සභාව දක්වා ඉදිරිපත් කර ඇති සියළු යෝජනා සඳහා මේ මාසේ 30 ට පෙර ඇස්තමේන්තු සකස් කර අවසන් කරන්න.

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව 2007 වර්ෂයේ ඉඳලා එක දිගටම විගණන මතය ලැබුණු ආයතනයක්. මෙවරත් ලැබිලා තියනවා. පූර්ව වසර ගණනාවක් තිස්සේ විගණන මතය ලැබිලා තියනවා මූල්‍ය පාලනය හා නිසි කළමනාකරණය සඳහා ඒක ප්‍රාදේශීය සභාව ලද ජයග්‍රහණයක්. පළාත් පාලන ආයතනවලට ලේසි කටයුත්තක් නෙවෙයි විගණන මතය ගන්න එක අපිට දිගින් දිගටම මතය ලැබුණා. මේ පිළිබඳව මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට. මේකට හේතුව තමයි අපිට ප්‍රාදේශීය සභාව හැටියට අපේ සභාව විසින් ගන්නා තීන්දු සහ තීරණ තමා මේ කොට්ඨාශ තුල ක්‍රියාත්මක වෙන්නේ. ඒ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ විසින් ලබා දුන් සහයෝගය පිළිබඳ විශේෂයෙන් මේ වෙලාවේදී මගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය දැඩි වෙහෙසක් දරලා දැඩි කැපවීමකින් යුක්තව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ කටයුතු ඉතාම නිවැරදිව කරන්න දැඩි වෙහෙසක් දරලා තියනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපිට මේ විගණන මතය ලැබිලා තියෙන්නේ. ඒ නිසා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට මගේ ගෞරවණීය ස්තූතිය පුද කරනවා අපිට විගණන මතය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව.

අල බෝග වගාව පිළිබඳ ආදර්ශ ව්‍යාපෘතිය සඳහා තමා සතුව තිබූ වැල් අල මුල් බීජ ප්‍රමාණයක් වගාව ප්‍රචලිත කිරීම සඳහා කමිටු සාමාජිකයන් අතර බෙදා දීමට ලබා දීම වෙනුවෙන් ප්‍රජා සංවර්ධන නිලධාරි මහතා වෙත ස්තූති ලිපියක් සකස් කර යවන්න.

හෝල්ගම හන්දිය කුණු දාන එක නවත්තන්නේ නෑ. වරිපනම් අය නොකර තැනක් හදන්නත් බෑ. කුණු දාන්න එපා දැම්මොත් දඩ ගහනවා කියලා බෝඩ් එකක් ගහන්න. මේක පුරුද්දක් බවට පත් වෙලා තියෙන්නේ. එතන වැටක් ගහන්න උණ බටවලින් ලොකු පැළ හිටවන්න. ගමේ ඇතුලේ දැන්වීමක් දාන්න කුණු දාන්න එපා කියලා. සිරිසර ලියන මහතාත් එක්ක කථා කරලා CCTV කැමරා හයි කරන්න කථා කරගන්න.

<u>ගරු මන්ත්‍රී එන්.එම් සුසිලා දමයන්ති මිය</u>

ගම්මැද්ද සොහොන ළඟ බෝක්කුව කඩා ගෙන යනවා වතුර පාරක් ඇවිත්.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

කැඩී ගිය තැන් බලන්න යන්න අපේ කට්ටිය යවන්න. අනික් අය එනකල් බලන් ඉන්න එපා.

<u>ගරු මන්ත්‍රී අයි.රාමකිලි මහතා</u>

ටෙම්පල්ස්ටෝව් ඉන්වාරා පාලම කඩාගෙන ගිහින් අවුරුදු 2 ක් වෙනවා තවම විසඳුමක් නෑ. ඉන්වාරා ක්‍රීඩාපිටිය කපන්න JCB දුන් නෑ.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

JCB එකෙන් මේ දවස්වල ලොකු වැඩක්. ලබන සතියේ දෙන්න පුළුවන්. ඉන්වාරා වැඩෙත් ලොකු වැඩක්. මම බලන්නත් ගියා. සාමාන්‍යයෙන් ලක්ෂ 40 ක් 50 ක් විතර යයි.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>

වර්ෂාවත් එක්ක පාරට පස් කඳු කඩා වැටිලා තියනවා. වැලිගම්පල ඉඳලා තැන් 10 ක් විතර තියනවා. PRDA එකෙන් පස් ටික අයින් කරලා ගමනාගමනය පහසුවෙන්න හදලා දුන්නා. PRDA එකට ලිපියක් දාන්න සභාවෙන් හරි පස් ටික ඇදලා දෙන්න කියලා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

PRDA සභාපතිතුමාට මම කථා කරා. සතියක් ඇතුළත මැෂින් එක එවනවා කිව්වා. වලවල් වහන එක ටිකක් පරක්කු වෙයි කිව්වා භූමිතෙල් නැල්ලු ප්‍රිමික්ස් හදන්න.

<u>ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා</u>

බව්වාගම හන්දියට යන සෙන්ට්‍රල් ඉස්කෝලේ ළඟ ඉඳලා තියන පාර සම්පූර්ණ කැලේ වෙලා. කාණු ඇත්තෙම නෑ. ඊළඟ වර්ෂා කාලයේදී මීට වඩා හානියක් වෙනවා පාරවල් හෝදගෙන ගිහිල්ලා. කම්කරුවන් කීපදෙනෙක් දාලා ශුද්ධ කරලා දෙන්න.

<u>ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා</u>

බලන්තොට ප්‍රදේශයේ වීථි ලාම්පු සියල්ලම අක්‍රිය වෙලා තියෙන්නේ. පහුගිය අවුරුද්දේ කීපයයි දාන්න පුළුවන් වුනේ. දැනට 10 ක් පමණ තමා ක්‍රියාත්මක තත්වයේ තියෙන්නේ. බල්බ් තමා දාන්න තියෙන්නේ. වීථි ලාම්පු ටික ප්‍රධාන පාර දිගේ හරි දාන්න.

<u>ගරු මන්ත්‍රී වී.මුරලිදරන් මහතා</u>

කඩියන්ලෙන ටෙම්පල්ස්ටෝව් දක්වා පාර කැඩිලා ඒක හදන්න ඕනි.

<u>ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා</u>

රඹුක්පිටිය ඉස්කෝලේ ළඟ බස් හෝල්ට් එකේ වීථි ලාම්පු අක්‍රියයි. නන්නාදුනන පුද්ගලයන් සැරිසරන ප්‍රදේශයක් වෙලා තියනවා අපේ ප්‍රදේශය. අපි මේ සම්බන්ධව කටයුතු කරනකොට අපේ ජීවිතවලටම තමයි අවදානම එන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මොනම හරි විසඳුමක් කරලා දෙනවානම් පරම්පරාවක් ගොඩගන්න පුළුවන්. මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරලා වැඩපිළිවෙලක් කරනවානම් හොඳයි. අපේ මන්ත්‍රීවරු සියලුදෙනා මේ සම්බන්ධව සහයෝගය දක්වයි. නීතිය පැත්තෙන් සාධාරණයක් පුළුවන් නම් උපරිම සහයෝගය දක්වන්න පුළුවන්.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

මත්ද්‍රව්‍ය පිළිබඳව ලොකු ව්‍යසනයක් තියනවා පහුගිය කාලෙම අපි සභාවෙත් සාකච්ඡා කළා. මේ වෙලාවේ ස්තූතිවන්ත වෙනවා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී තුමන්ලාට ක්‍රියාකාරීව මේ වෙනුවෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන්. මම පෞද්ගලිකව දන්න දෙයක් තමයි පොලිස් ස්ථානාධිපතිතුමා මේ සම්බන්ධව ලොකු සහයෝගයක් දෙනවා. සමාජය සහ පොලීසිය ගොඩක් දුරස් වෙලා පහුගිය කාලේ තිබ්බ තත්වයත් එක්ක. දැන් අපි නිසි ක්‍රියාකාරීත්වයට පත් වෙමින් යනකොට අපිට සිද්ධ වෙනවා ඒ සඳහා ක්‍රියාකාරීව දායක වෙන්න. ඒ සඳහා අපි පොලිස් ස්ථානාධිපතිතුමා සමඟ වෙලාවක් දාගෙන සාකච්ඡාවක් දාගමු. අපි පොඩි ක්‍රමවේදයක් හදාගමු තොරතුරු ටික දෙන විධියක් ගැන.

<u>ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය</u>

අපිට වතුර ටික හදලා දෙන්න. සභාපතිතුමා, ලේකම්තුමිය, තාක්ෂණ නිලධාරිතුමා ඇවිත් බලන්න. වෙනස් කරලා හැමෝටම දෙන්න ගිය නිසා දැන් අක්‍රිය වෙලා.

<u>ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා</u>

තාක්ෂණික දෝෂයක් තියනවාද බලමු. වෙලාවක් දාලා ජල පාරිභෝගිකයන්ට එන්න කියලා සංශෝධනය කරලා හදා ගමු.